# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1853/5 - 2014 මාර්තු මස 10 වැනි සඳුදා - 2014.03.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : T7/37/2004.

### කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2011.02.10 දිනැති හා අංක 1692/26 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2011.02.02 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් කොළඹ 05, කිරුලපන, මහවෙල පෙදෙස, අංක 14 හි පිහිටි ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් එයාර්ක්‍රාෆ්ට් ටෙක්නීෂියන්ස් ඇසෝසියේෂන් හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 01, ඇවිලන් චතුරස්‍රය, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, 19-22 නැගෙනහිර කුළුණ හි පිහිටි ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2014.02.13 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2014 මාර්තු මස 05 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය : ටී7/37/2004.

කාර්මික අධිකරණයේදීය

ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් එයාර්ක්‍රාෆ්ට්
ටෙක්නීෂියන්ස් ඇසෝසියේෂන්,
අංක: 14, මහවෙල පෙදෙස,
කිරුලපන,
කොළඹ 05.

ඉල්ලුම්කරු

නඩු අංකය : A/3372

ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් ලිමිටඩ්,
19 - 22 නැගෙනහිර කුළුණ,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය,
ඇවිලන් චතුරශ්‍රය,
කොළඹ 01.

වගඋත්තරකරු

ප්‍රදානය

වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියැවෙන) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය, 1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කම්කරු ආරාවුල් පණතේ 4(1) වන වගන්තියෙන් ගරු කම්කරු අමාත්‍යතුමාට පැවරී ඇති බලතල අනුව, ඉහත පාර්ශ්වයන් අතර පවත්නා කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරුවෙකු ලෙස 2011.02.02 වෙනි දින හෝ ඊට ආසන්න දිනැති නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

දෙපාර්ශවය අතර පවතින ආරවුල මෙසේය :-

ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් ලිමිටඩ් විසින් මෙහි නම් සඳහන් සේවකයින් දහතුන් දෙනාගේ සේවය අවසන් කිරීම යුක්තිසහගතද යන්න හා නොඑසේ නම් ඔවුන් එකිනෙකාට කුමන සහනයක් හිමිද යන් පිළිබඳව වේ.

01. ටී. එම්. ඊ. කාසිම් මහතා
02. එම්. ජී. ඒ. ඩී. චන්ද්‍රපාල මහතා

1 A – G 19220 — 75 (2014/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

03. පී. ඒ. ඩී. එස්. පෙරේරා මහතා
04. යූ. එල්. එම්. පෙරේරා මහතා
05. බී. පී. එන්. ද සිල්වා මහතා
06. එම්. වී.එස්. කුරේ මහතා
07. ඕ. එම්. ඒ. ඒ. පෙරේරා මහතා
08. ජී. ජී. සරත්චන්ද්‍ර මහතා
09. එන්. එම්. වී. කේ. රණසිංහ මහතා
10. වී. වික්‍රමසිංහ මහතා
11. ජේ. ඒ. අනුර මහතා
12. එස්. එස්. පී. එච්. මාහිංගොඩ මහතා
13. කේ. එන්. සී. පෙරේරා මහතා

ඉහත යොමු කිරීමට පෙර එවකට කම්කරු සබඳතා සහ විදේශ රැකියා නියුක්ත ගරු අමාත්‍යවරයා වන අතාවුද සෙනෙවිරත්න මහතා විසින් අංක 08 කම්කරු විනිශ්චය සභාවේ සභාපති/අතිරේක මහේස්ත්‍රාත්වරයා වශයෙන් මා සේවය කරමින් සිටියදී පාලිත වීරසේකර වන මාගේ නමට කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2004.07.20 වෙනි දින මෙම කාර්මික ආරවුල යොමු කර තිබිණ. ඉහත ආරවුල සම්බන්ධයෙන් සාක්ෂිකරුවන් 16 දෙනෙකුගේ සාක්ෂි මා ඉදිරියේ මෙහෙයවීමෙන් අනතුරුව 2010.04.16 වෙනි දින සිට මා විශ්‍රාම ගැනීම හේතු කොට ගෙන ඉහත ආරවුල නිම කිරීමට නොහැකි විය.

ඉන් අනතුරුව ඉහත මාගේ පත්වීම අවලංගු කොට නැවත වරක් මා බේරුම්කාර මණ්ඩලයට පත් කිරීමෙන් අනතුරුව මෙම ආරවුල නිම කිරීම සඳහා මා වෙත යොමු කර ඇත. ඉහත යොමු කිරීමෙන් අනතුරුව වගඋත්තරකාර පාර්ශවය සිය නඩුව අවසන් කල අතර, ඉල්ලුම්කාර පාර්ශ්වය බී. පී. එන්. ද සිල්වා වන ඉල්ලුම්කරු සාක්ෂියට කැඳවීමෙන් අනතුරුව නඩුව අවසන් කොට දෙපාර්ශවයම සිය ලිඛිත සැල කිරීම් සමග ලකුණු කරන ලද ලේඛන බේරුම්කරණයට භාර දෙන ලදී.

මෙම ආරවුල අංක 8 කම්කරු විනිශ්චය සභාවේදී කැඳ වූ අවස්ථාවේදී දෙවන පාර්ශවය වන වගඋත්තරකාර පාර්ශවය මූලික විරෝධතාවයක් ඉදිරිපත් කිරීම මත දෙපාර්ශවයම ඊට අදාළව ලිඛිතව සැලකිරීම් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2005.06.03 වෙනි දින නියෝගයක් මවිසින් ලබා දෙන ලදී. එකී නියෝගයේ මෙසේ සඳහන්ව ඇත.

"දෙවන පාර්ශවය ලකුණු කරන ලද ලේඛන සම්බන්ධව පළවන පාර්ශවයට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් නොලැබුණි. එසේම ඉල්ලුම්කාර පාර්ශවය සඳහන් කල පරිදි දෙවන පාර්ශවය කම්කරු විනිශ්චය සභාවේදී මේ පිළිබඳව එකඟවීමෙන් අනතුරුව දෙවන වරට මෙම මූලික විරෝධතාවය ඉදිරිපත් කර තිබුණේද යන්න මූලික විරෝධතාවය මත ඉදිරිපත් කරන ලද ලිඛිත සැලකිරීම් මතම නිගමනය කළ නොහැකි කරුණක් බව සලකා නඩුව අවසානයේදී ඉහත විරෝධතාවය මත නියෝගයක් ලබා දෙන බව 2005.06.03 වෙනි දින නියෝගයේදී තීරණය කර ඇත. දැනට මෙම නඩුව අවසන්ව ඇති හෙයින් ප්‍රථමයෙන්ම එකී මූලික විරෝධතාවය සම්බන්ධව නියෝගය ලබා දිය යුතු බව මම නිගමනය කරමි."

වගඋත්තරකරු හෙවත් දෙවන පාර්ශවය සිය කරුණු ඉදිරිපත් කරමින් මෙම ඉල්ලුම්කරුවන් දහතුන් දෙනා මීගමුව අංක 21 දරන අතිරේක කම්කරු විනිශ්චය සභාවට සේවය අවසන් කිරීම මත පදනම්ව සහන ඉල්ලා ඉල්ලුම් පත් යොමු කොට ඇති බවද, එයින් හතර දෙනෙකුගේ ඉල්ලුම්පත් 2004.06.23 වෙනි දින යොමු කර ඇති බවත්, සෙසු ඉල්ලුම්කරුවන් නව දෙනා 2004.07.19 වෙනි දින අදාළ ඉල්ලුම් පත් යොමු කර තිබෙන බව වගඋත්තරකරු සඳහන් කළ අතර, ඊට අදාළ ඉල්ලුම් පත්වල පිටපත් R/01 සිට R/13 වශයෙන් ලකුණු කොට බේරුම්කරණයට ඉදිරිපත් කර තිබිණ.

කම්කරු සබඳතා හා විදේශ රැකියා නියුක්ති අමාත්‍යවරයා විසින් කාර්මික ආරවුල් පනතේ 4(I) වගන්තිය යටතේ ඉල්ලුම්කරුවන්ගේ සේවය අවසන් කිරීම මත පදනම්ව අංක 08 කම්කරු විනිශ්චයට යොමු අංක T7/37/2004 යටතේ එහි සභාපති වූ පාලිත වීරසේකර වන මා පත් කොට ඉහත යොමුව 2004.07.20 වෙනි දිනෙන් යුතුව මා වෙත යොමු කොට ඇති අතර, ඊට අදාළ ලේඛනය වගඋත්තරකරු R/15 වශයෙන් ලකුණු කොට බේරුම්කරණයට ඉදිරිපත් කර තිබිණ.

මීගමුව කම්කරු විනිශ්චය සභාවට සිය සේවය අවසන් කිරීම මත පදනම්ව ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව කම්කරු අමාත්‍යවරයාට කාර්මික ආරවුල් පනතේ 4(I) වගන්තිය යටතේ ඉහත දැක්වෙන ආරවුල යොමු කිරීමට නොහැකි බවද, ඉහත යොමු කිරීම නීතිමය දෝෂ සහිත යොමු කිරීමක් බවත්, ඒ අනුව ඉහත ඉල්ලුම් පත් නිෂ්ප්‍රභා කරන ලෙස ඉල්ලමින් ඉහත විරෝධතාවය මතු කර තිබිණ. ඊට අදාළව තවදුරටත් කරුණු දක්වමින් උපාලි නිව්ස් පේපර්ස් ලිමිටඩ් VS එක්සත් කම්කරු සමිතිය සහ තවත් අය යන නඩුවේදී ඒ පිළිබඳව තීරණය කර තිබෙන බවද, මෙම නඩුවේ අභියාචනාධිකරණ නියෝගය ශ්‍රේෂ්ඨාධිකරණය මගින්ද පිළිගෙන ඇති බව වගඋත්තරකාර පාර්ශ්වය සිය කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර තිබිණ.

ඉල්ලුම්කාර පාර්ශවය ඉහත ස්ථාවරය ප්‍රතික්ෂේප කරමින් මෙම නඩුවට අදාළ සිද්ධිමය කරුණු වෙනස් බවද මීගමුව අංක 21 අතිරේක කම්කරු විනිශ්චය සභාවට ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මෙම බේරුම්කරණය පවත්වා ගෙන යාමට වගඋත්තරකරු එකඟ වී ඉහත ඉල්ලුම් පත්‍ර නිෂ්ප්‍රභා කරන ලෙස ඉල්ලා සිටි බවද, එම අවස්ථාවේදී ඉල්ලුම්කාර පාර්ශවය මෙම ඉල්ලුම් පත් පසෙක තබන ලෙස ඉල්ලීමක් කළ බවද එහිදී අංක 21 මීගමුව අතිරේක කම්කරු විනිශ්චය සභාව ඉහත වගඋත්තරකරු ඉදිරිපත් කළ කරුණු සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව ඉහත ඉල්ලුම්පත් නිෂ්ප්‍රභා කළ බවද එසේ කිරීමේදී පාර්ශවයන් සතු අයිතිවාසිකම් අගතියක් නොවන පරිදි නිෂ්ප්‍රභා කර ඇති බවද, ඒ අනුව මෙකී මූලික විරෝධතාවය ප්‍රතික්ෂේප කරන ලෙස පළමු පාර්ශවය හෙවත් ඉල්ලුම්කරුවන් වෙනුවෙන් කරුණු දක්වමින් බේරුම්කරණයෙන් අයැද තිබුණි. ඉල්ලුම්කරුවන් අංක 21 මීගමුව අතිරේක කම්කරු විනිශ්චය සභාවට ඉල්ලුම්පත් ඉදිරිපත් කර තිබූ බව වගඋත්තරකරු ලකුණු කරන ලද ආර් 01 සිට ආර් 13 දක්වා ලේඛන අනුව තහවුරු වේ. එම ඉල්ලුම්පත් අතරින් 04 ක් 2004.06.23 දින ඉදිරිපත් කර ඇති අතර සෙසු ඉල්ලුම්පත් 2004.07.19 වැනි දින ඉදිරිපත් කර තිබූ බව අංක 21 මීගමුව කම්කරු විනිශ්චය සභාවේ ලේකම්වරයා සිය සාක්ෂියේදී සඳහන් කර තිබූ අතර ඉහත කරුණු ඉල්ලුම්කාර පාර්ශවයද භාර කිරීමකින් තොරව පිළිගෙන තිබුණි.

බේරුම්කරණයට ඉහත යොමුව පැමිණීමෙන් අනතුරුව දෙපාර්ශයටම සිය ප්‍රකාශ ගොනු කරන ලෙස අංක 8 කම්කරු විනිශ්චය සභාව දැනුම්දීමෙන් අනතුරුව ඊට අදාළ ප්‍රකාශ පාර්ශවයන් විසින් ගොනු කර තිබුණි. බේරුම්කරණයට 2004.09.07 දින පාර්ශවයන් කැඳවූ අවස්ථාවේදී මීගමුව අංක 21 අතිරේක කම්කරු විනිශ්චය සභාවේ ඉල්ලුම්පත් ඉල්ලා අස්කර ගන්නා බව

බේරුම්කරණයට ඉල්ලුම්කරුවන් විසින් දැනුම් දී ඇත. මෙම ආරවුල 2004.09.21 දින මීගමුව කම්කරු විනිශ්චය සභාවේ කැඳවන බව දැනුම්දීම හේතු කොට ගෙන 2004.10.20 දිනයේදී නැවත අංක 8 කම්කරු විනිශ්චය සභාවේදී කැඳවන බව පාර්ශවයන්ට දැනුම් දී තිබෙන බව 2004.09.07 දින කාර්ය සටහනේ දැක්වේ.

2004.10.07 දින වගඋත්තරකරු වෙනුවෙන් හාම්පුතුන්ගේ සංගමය පෙනී සිටිමින් බේරුම්කරණයට ලේඛනයක් ඉදිරිපත් කරමින් නීතිඥ ඩබ්. ඩී. ඩී. ද අල්විස් මහතා අංක 21 කම්කරු විනිශ්චය සභාවට කරුණු දැක්වීමක් කර ඇත.

දෙවැනි පාර්ශවය බේරුම්කරණය ගෙන යාමට එකඟ බවත්, ඒ අනුව මීගමුව කම්කරු විනිශ්චය සභාවේ ඉල්ලුම්පත් නිෂ්ප්‍රභා කරන ලෙසත්, අයැද ඇති බව 2004.10.07 වැනි දින දරන එකී ලිපියේ දැක්වේ. එම ලිපිය මගින් කාර්මික ආරවුල් පනතේ 31 B උපවගන්ති 2(B) කෙරෙහිද අවධානය යොමු කර තිබෙන බව එම ලිපියේ සඳහන්ව ඇති කරුණු අනුව අනාවරණය වේ. ඉහත ලිපිය සමග අංක 21 මීගමුව කම්කරු විනිශ්චය සභාවට 2004.08.16 දිනින් යුතුව ඉදිරිපත් කරන ලද මෝසම් පතක පිටපතක් ද ඉහත ලේඛනය සමග ඉදිරිපත් කර ඇත. එම ලේඛනය මගින්ද වගඋත්තරකරු ඉහත ඉල්ලුම්පත් නිෂ්ප්‍රභා කරන ලෙස ඉල්ලා ඇති අතර බේරුම්කරන නඩුව ගෙන යාමේ අදහස ඇතිව ඉහත ඉල්ලීම කර තිබෙන බව ඉහත ලේඛනවල සඳහන්ව ඇත.

මෙම නඩුවට වගඋත්තරකරු වෙනුවෙන් පෙනී සිට ඇත්තේ හාම්පුතුන්ගේ සංගමයේ නීතිඥ ඩබ්. ඩී. ඩී. ද අල්විස් මහතා බවද එකී ඉල්ලීම වගඋත්තරකරු වෙනුවෙන් ඉදිරිපත් කර තිබෙන බවද ඉහත ලේඛනවල අන්තර්ගතය අනුව තහවුරු වේ.

මීගමුව අංක 21 අතිරේක කම්කරු විනිශ්චය සභාවට වගඋත්තරකරු වෙනුවෙන් හාම්පුතුන්ගේ සංගමය 2004.08.16 දින මෝසම් පතක් ගොනු කරමින් මෙම නඩුවට අදාල ඉල්ලුම්කරුවන් 13 දෙනා සම්බන්ධයෙන් කම්කරු සබඳතා හා විදේශ රැකියා නියුක්ත අමාත්‍යතුමා විසින් අංක 8 කම්කරු විනිශ්චය සභාවට අනිවාර්යය බේරුම්කරණයට ඉහත ඉල්ලුම්කරුවන්ගේ සේවය අවසන් කිරීම සම්බන්ධව යොමු කිරීමක් කර ඇති බවද ඊට අදාළ ලේඛණ වල පිටපත් සමග දැනුම් දෙමින් මීගමුව අංක 21 අතිරේක කම්කරු විනිශ්චය සභාවේ ඉල්ලුම්පත් නිෂ්ප්‍රභා කරන ලෙස ඉල්ලීමක් කර ඇත.

ඉහත ඉල්ලීමෙන් අනතුරුව ඒ පිළිබඳව වාචික සැලකිරීම් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ලිඛිත සැලකිරීම්ද ලබා දී ඇති බව මීගමුව අංක 21 කම්කරු විශ්චය නියෝගයේ සඳහන්ව ඇත.

මෙම නියෝගය ලබා දීමට ප්‍රථම ඉල්ලුම්කාර පාර්ශවය මෙම ආරවුල බේරුම්කරණයට යොමු කිරීම මත පදනම්ව මෙම ඉල්ලුම්පත් පසෙක තබන ලෙස මීගමුව කම්කරු විනිශ්චය සභාවෙන්ද ඉල්ලීමක් කර ඇත. එකම කරුණු මත පදනම්ව ඇති හෙයින් මෙම ඉල්ලුම්පත්‍ර කාර්මික ආරවුල් පනතේ 31 B 2 (B) වගන්තියට අනුව නිෂ්ප්‍රභා කරණ ලෙස ඉල්ලීමක්ද වගඋත්තරකරු විසින් කර ඇත. වගඋත්තරකරු මෙම බේරුම්කරණයට ඉදිරිපත් කරන මෝසම් පතේද ඉහත කරුණු සඳහන්ව ඇත.

ඉහත ඉල්ලීම සලකා බැලීමෙන් අනතුරුව මීගමුව අංක 21 කම්කරු විනිශ්චය සභාව ඉහත ඉල්ලුම්කරුගේ අයිතිවාසිකම් වලට අගතියක් නොවන පරිදි අදාල ඉල්ලුම්පත් 2004.11.23 දින නිෂ්ප්‍රභා කර ඇත.

අංක 8 කම්කරු විනිශ්චය සභාවට යොමු කරන ලද බේරුම්කරනය මගින් මෙම ආරවුල ගෙන යාමට වගඋත්තරකරු කැමැත්ත පළ කිරීම මත ඊට ඉඩ ලබා දෙමින් මීගමුව අංක 21 කම්කරු විනිශ්චය සභාව ඉහත ඉල්ලුම්පත් නිෂ්ප්‍රභා කර තිබෙන බව ඉහත කරුණු අනුව පිළිගත හැකිය.

වගඋත්තරකරු නගන ලද මෙම මූලික විරෝධතාවය මීගමුව අංක 21 කම්කරු විනිශ්චය සභාවට මුල් අවස්ථාවේදී දැනුම්දිය හැකිව තිබූ විරෝධතාවයකි. එසේම එම විරෝධතාවය අංක 8 කම්කරු විනිශ්චය සභාවට කැඳවූ මුල් අවස්ථාවේදීම කළ හැකිව තිබියදී එසේ සිදුකර නොමැති අතර, ඊට හේතුද ඉදිරිපත් කර නැත.

මීගමුව අංක 21 කම්කරු විනිශ්චය සභාව ලබා දුන් තීන්දුව පරිදි ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලුම්පත් නිෂ්ප්‍රභා වී ඇත. ඒ අනුව ඉල්ලුම්කරුවන්ට මෙම නඩුව ගෙන යා හැක්කේ බේරුම්කරණය මගින් පමණි. වගඋත්තරකරු කරන ලද මෙම මූලික විරෝධතාවය පිළිගතහොත් වාසිය ලැබෙන්නේ වගඋත්තරකරුටය වගඋත්තරකරු මෙම අවස්ථාවේදී උපාලි නිවුස් පේපර්ස් ලිමිටඩ් නඩුව උපයෝගී කර ගෙන නීතිමය සිද්ධාන්ත මත ඉල්ලුම්පත්‍ර පවත්වා ගෙන යා නොහැකි බවට කරුණු ඉදිරිපත් කර ඇත. මෙම වගඋත්තරකරුට මීගමුව අංක 21 අතිරේක කම්කරු විනිශ්චය සභාවට එම නීතිමය සිද්ධාන්තය නොසලකා හැර අංක 8 කම්කරු විනිශ්චය සභාව ඉදිරියේ අනිවාර්යය බේරුම්කරණය ගෙන යාමට එකඟතාවය පළ කිරීමෙන් පසුව මෙම ස්ථාවරය ගෙන තිබෙන බව බේරුම්කරනයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව තහවුරු විය.

මීගමුව අංක 21 අතිරේක කම්කරු විනිශ්චය සභාවද අධිකරණ නිලධාරියකු විසින් මෙහෙයවනු ලබන විනිශ්චය ආයතනයකි. එවැනි අධිකරණයට නිවැරදිව කරුණු ඉදිරිපත් කිරීමේ වගකීමක් පාර්ශවයන් සතුව පවතින අතර, ඉහත අධිකරණයට ලබා දුන් එකඟතාවයට පටහැනිව පියවර ගනිමින් මෙම මූලික විරෝධතාවය ඉදිරිපත් කර තිබෙන බව බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව පිළිගත හැකිය. මීගමුව අංක 21 අතිරේක විනිශ්චය සභාවේදී ඉහත ඉල්ලුම්පත් නිෂ්ප්‍රභා කරන ලෙස වගඋත්තරකාර පාර්ශවය කරුණු දැක්වීමෙන් අනතුරුව ඉල්ලීමක්ද කර ඇති අතර, ඒ අනුව කාර්මික ආරවුල් පනත යටතේ 31B 2(B) වගන්තිද සැලකිල්ලට ගන්නා ලෙස වගඋත්තරකරු කරුණු දැක්වීමෙන් අනතුරුව ඉහත නියෝගය ලබා දී තිබෙන බව පිළිගත හැකිය.

වගඋත්තරකරුට නීතිමය සිද්ධාන්ත මත කටයුතු කිරීමට සැබෑ වුවමනාවක් තිබුනේ නම් මෙම නඩුව බේරුම්කරණයට කැඳවූ මුල් දිනය වන විටත්, එම විරෝධතාවය මතු කිරීමේ හැකියාව තිබූ බවද පිළිගත හැකිය. එම අවස්ථාවේදී මෙම විරෝධතාවය ඉදිරිපත් කලේ නම් මීගමුව අංක 21 අතිරේක කම්කරු විනිශ්චය සභාවේ ඉල්ලුම්පත් පවත්වා ගෙන යාමේ හැකියාවක් තිබෙන බවද පිළිගත හැකිය. ඉහත නීතිමය සිද්ධාන්තය පිළිබඳව වගඋත්තරකරුට අවබෝධයක් තිබූ බවද, ඒ අනුව මීගමුව අංක 21 කම්කරු විනිශ්චය සභාවට බේරුම්කරණය ගෙන යාමට එකඟතාවයක් පළකර තිබෙන බවද, බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව පිළිගත හැකිය.

වගඋත්තරකරු වෙනුවෙන් පෙනී සිටි හාම්පුතුන්ගේ සංගමයේ නීතිඥ ඩබ්. ඩී. ඩී. ද අල්විස් මහතා අංක 08 බේරුම්කරණය ගෙන යාමට සිය කැමැත්ත පළ කර ඇත්තේ වගඋත්තරකාර පාර්ශවයට එකී ආරවුල ගෙන යෑමේ අදහසක් ඇතිව බව බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව තහවුරු වේ. කාර්මික ආරවුල් පනතේ 31

(බී), 2(බී) වගන්තිය ප්‍රකාරව මෙම ඉල්ලුම් පත් නිෂ්ප්‍රභා කරන ලෙස ඉල්ලීමක් කර ඇත්තේද වගඋත්තරකාර පාර්ශවය නියෝජනය කළ එම නීතිඥ මහතාය.

ඉහත සඳහන් සියළුම කරුණු සැලකිල්ලට ගෙන මීගමුව අංක 21 අතිරේක කම්කරු විනිශ්චය සභාව විසින් ලබා දුන් නියෝගයේ ඉල්ලුම්කරුවන්ගේ අයිතිවාසිකම්වලට අගතියක් නොවන පරිදි ඉහත නිෂ්ප්‍රභා කිරීමේ නියෝගය ලබා දී ඇත්තේ ඉහත ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලුම් පත් බේරුම්කරණය ඉදිරියේ පවත්වා ගෙන යාමේ අදහස ඇතිව බවද පිළිගත හැකිය.

මීගමුව අංක 21 කම්කරු විනිශ්චය සභාවෙන් 2004.11.23 වෙනි දින නියෝගය ලැබීමෙන් අනතුරුව වගඋත්තරකාර සමාගම 2004.12.14 වෙනි දිනෙන් යුතුව ප්‍රකාශයක් ගොනු කරමින් අංක 08 කම්කරු විනිශ්චය සභාවට ගරු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කර ඇති අනිවාර්ය බේරුම්කරණය නීතිමය දෝෂ (Bad in Law) සහිතව ඉදිරිපත් කර ඇති බැවින් පවත්වා ගෙන යා නොහැකි බවත්, ඒ අනුව නිෂ්ප්‍රභා කරන ලෙසද, අදාළ ප්‍රකාශ මගින් ප්‍රථම වරට ඉල්ලීමක් කර ඇත.

අමාත්‍යවරයා විසින් යොමු කරන ලද අනිවාර්ය බේරුම්කරණය අංක 08 කම්කරු විනිශ්චය සභාවේ පවත්වා ගෙන යාමට කැමැත්ත ප්‍රකාශ කිරීමෙන් අනතුරුව මීගමුව අංක 21 කම්කරු විනිශ්චය සභාවෙන් නියෝගය ලබා ගැනීමෙන් අනතුරුව ඉහත විරෝධතාවය වගඋත්තරකරු ඉදිරිපත් කර තිබෙන බව තහවුරු වේ. ඒ අනුව මෙම විරෝධතාවය මතු කිරීම උදෙසා වගඋත්තරකරු පියවර ගෙන එතෙක් පෙනී සිටි හාම්පුතුන්ගේ සංගමය වෙනුවට වෙනත් නීතිඥ මහතෙකු මගින් මෙම ඉල්ලීම කර තිබෙන බවද තහවුරු විය.

ඉහත ඉදිරිපත් වූ කරුණු අනුව වගඋත්තරකරු මීගමුව අංක 21 කම්කරු විනිශ්චය සභාව ලබා දී තිබූ එකඟතාවය කඩ කරමින් මෙම මූලික විරෝධතාවය ඉදිරිපත් කර තිබෙන බව පිළිගත හැකිය. මීගමුව අංක 21 අතිරේක කම්කරු විනිශ්චය සභාවට සත්‍ය තොරතුරු දැනුම් දීමට වගඋත්තරකරුට හැකියාව තිබියදී එසේ නොකොට එම විනිශ්චය සභාවෙන් තම වාසියට තීන්දුව ලබා ගැනීමෙන් අනතුරුව මෙම විරෝධතාවය ඉදිරිපත් කර තිබෙන බවද මෙම අවස්ථාවේදී එකඟ වූ පරිදි කටයුතු නොකරමින් මෙම විරෝධතාවය ඉදිරිපත් කර තිබෙන බවද පිළිගත හැකිය. මෙම තත්ත්වය පිළිගත හොත් අධිකරණයකදී වන එකඟතා කඩ කිරීම් සිදු කිරීම් තුළින් අනිටු ප්‍රතිඵල ගෙන දෙන බවද පිළිගත හැකිය.

මීගමුව අංක 21 අතිරේක කම්කරු විනිශ්චය සභාවේ 2004.11.23 වෙනි දින නියෝගය පරිදි ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලුම් පත් සියල්ලම නිෂ්ප්‍රභා වී ඇත. එසේ නිෂ්ප්‍රභා වීමෙන් අනතුරුව මෙම විරෝධතාවය පිළිගත හොත් මෙම ඉල්ලුම් පත්ද නිෂ්ප්‍රභා විය යුතුය. වගඋත්තරකරුගේ ඉල්ලීම සලකා බැලීමෙන් අනතුරුව ලබා දී ඇති තීන්දුවට පදනම් වී ඇත්තේ අංක 08 කම්කරු විනිශ්චය සභාවේ පවතින බේරුම්කරණය ඉදිරියට ගෙන යාමය.

මීගමුව අංක 21 අතිරේක කම්කරු විනිශ්චය සභාව විසින් 2004.11.23 වෙනි දිනෙන් යුතුව දෙන ලද නියෝගයෙන් පසුව වගඋත්තරකරුට මෙම මූලික විරෝධතාවය මතු කිරීමට ඉඩ ලැබී ඇත. මීගමුව අංක 21 දරන අතිරේක කම්කරු විනිශ්චය සභාවේ මෙම ඉල්ලුම් පත් තිබියදී පෙර දැක්වූ උපාලි නිව්ස් පේපර්ස් ලිමිටඩ් නඩුව පරිදි කරුණු දැක්වීමක් කළේ නම් එම කම්කරු විනිශ්චය සභාවේදී මෙම නඩුව විභාගයට ගැනීමට හැකියාවක් තිබෙන බවද පිළිගත හැකිය.

කාර්මික ආරවුල් පනත යටතේ පිහිටුවා ඇති කම්කරු විනිශ්චය සභාව, බේරුම්කරණය වැනි ආයතන ඉදිරිපත් වූ සාක්ෂි මත තීන්දුවක් ලබා දීමේදී සාධාරණ හා යුක්තිසහගතව කටයුතු කල යුතු වන්නේය. එම සංකල්පය මත කටයුතු කිරීම උදෙසා සාක්ෂි ආඥා පනතේ දැක්වෙන ප්‍රතිපාදනවලින්ද නිදහස් කර තිබෙන බවද පිළිගත හැකිය.

වගඋත්තරකරු අංක 21 මීගමුව කම්කරු විනිශ්චය සභාව බේරුම්කරණය ඉදිරියට ගෙන යාමට කැමැත්ත පළ කිරීමෙන් පසුව එම කරුණ පිළිගෙන ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලුම් පත් පවත්වා ගෙන යාමට අගතියක් නොවන පරිදි නිෂ්ප්‍රභා කිරීමේ නියෝගයක් ලබා දී තිබූ බව බේරුම්කරණය ඉදිරිපත් වූ සාක්ෂි අනුව තහවුරු විය.

අංක 08 කම්කරු විනිශ්චය සභාවට යොමු කරන ලද බේරුම්කරණය ඉදිරියට ගෙන යාමට එකඟවීම හා පසුව එම ස්ථාවරයට පටහැනිව වගඋත්තරකරු කටයුතු කරනු ලැබුවේ කුමන හේතූන් නිසාද යන්න හෝ එකඟතාවය කඩකොට මෙම විරෝධතාවය මතු කිරීමට සාධාරණ හා යුක්තිසහගත හේතූන් තිබූ බවටද වගඋත්තරකරු බේරුම්කරණයට කිසිදු සාක්ෂියක් මගින් තහවුරු කිරීමටද අපොහොසත් විය.

ඉහත ඉල්ලුම් පත් නිෂ්ප්‍රභා කිරීම තුළින් මෙම විරෝධතාවය මතු කිරීමට වගඋත්තරකරු අවස්ථාවක් ලබා ගෙන තිබෙන බවද පිළිගත හැකිය. අංක 21 මීගමුව කම්කරු විනිශ්චය සභාවට එකඟ වූ කොන්දේසිය කඩ කරමින් මෙම විරෝධතාවය ඉදිරිපත් කර තිබෙන බවද, එය සාධාරණ හා යුක්තිසහගත නොවන බවද, ඉදිරිපත් වූ සියළුම සාක්ෂි සැලකිල්ලට ගෙන මම නිගමනය කරමි.

ඒ අනුව වගඋත්තරකරු නගන ලද මෙම විරෝධතාවය මම ප්‍රතික්ෂේප කරමි. මෙය සාධාරණ හා යුක්තිසහගත තීරණයක් වන හෙයින් මෙසේ ප්‍රකාශයට පත් කරමි.

ඉහත ඉල්ලුම්කරුවන්ගේ සේවය අවසන් කිරීම දෙවන පාර්ශවය හෙවත් වගඋත්තරකරු පිළිගෙන තිබූ හෙයින් අංක 08 කම්කරු විනිශ්චය සභාවේදී නඩුව ආරම්භ කරමින් සාක්ෂිකරුවන් 16 දෙනෙකු සාක්ෂියට කැඳවන ලදී. ඉන් අනතුරුව නැවත වරක් බේරුම්කරුවකු ලෙස මා පත් කිරීමෙන් පසුව මෙම ආරවුල කැඳවූ අවස්ථාවේදී වගඋත්තරකරු සාක්ෂි මෙහෙයවීම අවසන් කොට R/01 සිට R/72 දක්වා ලේඛන සමඟ ලිඛිත සැලකිරීම් බේරුම්කරණයට භාර දෙන ලදී.

ඉල්ලුම්කාර පාර්ශවය බී. පී. එන්. ද සිල්වා යන ඉල්ලුම්කරු සාක්ෂියට කැඳවීමෙන් අනතුරුව සාක්ෂි මෙහෙයවීම අවසන් කොට ලකුණු කරන ලද A/05 සිට A/43 දක්වා ලේඛන සමඟ ලිඛිත සැලකිරීම් බේරුම්කරණයට භාර දෙන ලදී.

ඉල්ලුම්කරුවන් 13 දෙනා ගුවන්යානා තාක්ෂණිකයන් වශයෙන් වගඋත්තරකාර සමාගමේ සේවය කර තිබූ බවද, එසේ සේවය කරමින් සිටියදී ඉහත ඉල්ලුම්කරුවන් කරන ලද විෂමාචාරයක් මත පදනම්ව චෝදනා පත්‍ර ලබා දීමෙන් අනතුරුව එම ඉල්ලුම්කරුවන්ගේ

සේවය වගඋත්තරකරු අවසන් කර තිබූ බව බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව තහවුරු විය.

වගඋත්තරකරු සිය පළමු ප්‍රකාශය සමග ඉල්ලුම්කරුවන්ට ලබා දුන් චෝදනා පත්‍රවල පිටපත් P/01 සිට P/13 දක්වා ලකුණු කොට තිබූ අතර, ඉල්ලුම්කරුවන්ගේ සේවය අවසන් කිරීමට අදාළව ලබා දුන් ලිපිවල පිටපත් Y/01 සිට Y/13 දක්වා ලකුණු කොට බේරුම්කරණයට ඉදිරිපත් කර තිබුණි. වගඋත්තරකරු සිය සාක්ෂි ඉදිරිපත් කිරීමේදී ඉල්ලුම්කරුවන්ට ලබා දෙන ලද චෝදනා පත්‍රවල පිටපත් R/65 (1) සිට R/65 (13) වශයෙන් ලකුණු කොට තිබූ අතර, ඕ. එම්. ඒ. ඒ. පෙරේරා වන ඉල්ලුම්කරුට 2004.03.23 වෙනි දිනෙන් යුතුව දෙන ලද චෝදනා පත්‍රය R/65 (2) වශයෙන් ද ඊට අමතරව එම ඉල්ලුම්කරුට 2004.03.31 දිනෙන් යුතුව දෙන ලද චෝදනා පත්‍රයක් R/67 වශයෙන්ද ලකුණු කොට බේරුම්කරණයට ඉදිරිපත් කර තිබුණි. ඉහත ඉල්ලුම්කරුවන්ගේ සේවය අවසන් කළ ලිපිවල පිටපත් R/66 (1) සිට R/66 (13) වශයෙන්ද ලකුණු කොට වගඋත්තරකරු බේරුම්කරණයට ඉදිරිපත් කර ඇත.

ඉල්ලුම්කාර පාර්ශවයද එස්. එස්. පී. එච්. මාහිංගොඩ යන ඉල්ලුම්කරුගේ චෝදනා පත්‍රයේ පිටපතක් A/23 වශයෙන්ද, ඊට අදාළව සේවය අවසන් කිරීමේ ලිපියේ පිටපත A/23 (a) වශයෙන්ද ලකුණු කොට තිබූ අතර, ඊට අමතරව ඉල්ලුම්කරුවන් හත් දෙනෙකුට දෙන ලද චෝදනා පත්‍රවල පිටපත් A/14 සිට A/21 දක්වා ලකුණු කොට බේරුම්කරණයට ඉදිරිපත් කර තිබිණි.

බේරුම්කරණයට ඉදිරිපත් වූ ලේඛන අනුව ඕ. එම්. ඒ. ඒ. පෙරේරාට 2004.03.31 වෙනි දිනැති චෝදනා පත්‍රයට අමතරව 2004.03.23 වෙනි දිනෙන් යුතුවද චෝදනා පත්‍රයක් දී තිබූ බව පිළිගත හැකිය. එම ඉල්ලුම්කරුගේ සේවය අවසන් කිරීමට අදාළව නිකුත් කර ඇති ලිපිය 2004.03.23 වෙනි දිනට අදාළව ලබා දී තිබූ චෝදනා පත්‍රයේ චෝදනාවලට එම ඉල්ලුම්කරු විසින් 2004.03.30 වෙනි දින ලබා දී තිබූ නිදහසට කරුණු පිළිගත නොහැකි හෙයින් සේවයෙන් පහ කරන බව අදාළ ලිපිය මගින් එම ඉල්ලුම්කරුට දැනුම් දී තිබූ බව පිළිගත හැකිය. ඉහත චෝදනාවන්ට අමතරව 2004.03.31 වෙනි දිනෙන් යුතුව චෝදනා පත්‍රයක් ඉල්ලුම්කරුට දී තිබූ බව R/67 ලේඛනය අනුව අනාවරනය වූවද එම ඉල්ලුම්කරුගේ සේවය අවසන් කිරීමට එම චෝදනා පත්‍රය අදාළ වී නැති බව R/66 (2) වශයෙන් ලකුණු කරන ලද සේවය අවසන් කිරීමේ ලිපිය අනුව පිළිගත හැකිය.

ඉහත ඉල්ලුම්කරුවන්ට චෝදනා පත්‍ර නිකුත් කිරීමෙන් අනතුරුව එම චෝදනා සම්බන්ධයෙන් ඉල්ලුම්කරුවන් හේතුන් ඉදිරිපත් කර තිබූ බව එම සේවය අවසන් කිරීමේ ලිපිවල අන්තර්ගත කරුණු අනුව පිළිගත හැකිය. ඉල්ලුම්කරුවන් ඉදිරිපත් කළ හේතුන් දැක්වෙන ලිපි වගඋත්තරකරු බේරුම්කරණයට ඉදිරිපත් කර නොතිබුණි. ඉහත ලිපිවල හේතු පිළිනොගැනීම මත ඉල්ලුම්කරුවන්ගේ සේවය අවසන් කර තිබීම හා සේවය අවසන් කිරීමේ ලිපිවල ඉල්ලුම්කරුවන් හේතුන් ඉදිරිපත් කර දිනයන් සඳහන්ව තිබෙන හෙයින්ද, අදාළ ලිපිවල අඩංගු කරුණු සැලකිල්ලට ගෙන වගඋත්තරකරු ඉල්ලුම්කරුවන්ගේ සේවය අවසන් කර තිබෙන බව බේරුම්කරණයට ඉදිරිපත් වූ සේවය අවසන් කිරීමේ ලිපි අනුව පිළිගත හැකිය.

සේවා මුර මාරු කිරීමෙන් අනතුරුව සේවයට වාර්තා නොකිරීම මත ඉල්ලුම්කරුවන් කීප දෙනෙකුගේ සේවය අවසන් කර තිබූ බව තහවුරු විය. ඉහත පරිදි සේවය අවසන් කිරීම සාධාරණ හා යුක්තිසහගත වන්නේද යන්න විමසා බැලිය යුතු කරුණක් වේ.

මෙම බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව ඉල්ලුම්කරුවන් සියළු දෙනාම දිවා රාත්‍රී වශයෙන් සේවා මුර දෙකක් යටතේ සේවය කර තිබූ බව තහවුරු විය. මාසයක කාලයක් සඳහා මෙම සේවා මුර ක්‍රමයට අදාළව සේවකයින් සේවකයින් සේවයේ යොදවන බවද, ඊට අදාළ ලේඛණ වගඋත්තරකරු R/21, R/22, R/23, R/24, R/25, R/26, R/27, R/28, R/29, R/30, R/31, R/32, R/33 සහ R/34 වශයෙන් ලකුණු කොට බේරුම්කරණයට ඉදිරිපත් කර තිබිණ. ඉල්ලුම්කාර පාර්ශවයද ඉහත ලේඛන බේරුම්කරණයේදී හබ කිරීමකින් තොරව පිළිගෙන තිබිණ.

ඉල්ලුම්කරුවන් කියා සිටියේ මාසයක් තුළ සේවකයින්ව අනුයුක්ත කිරීමට අදාළ පියවර ගන්නා බවද, ඒ සම්බන්ධයෙන් කල් ඇතිව දැනුම් දීමක් කරන බවය. ඒ අනුව සේවකයින් තමාගේ විවේක දිනවලදී තම තමන්ගේ පුද්ගලික වැඩ යොදා ගන්නා බවද, ඒ අනුව හදිසි සේවා මාරු කිරීම් කළ අවස්ථාවලදී අපහසුතා ඇති වන බව ඉල්ලුම්කරුවන් වෙනුවෙන් කරුණු දක්වමින් සඳහන් කර තිබිණ.

සේවයට අනුයුක්ත කරනු ලබන කාල සටහනට අයත් මාසයට පෙර මාසයේ අන්තිම සතියේ එකී කාල සටහන දැනුම් දෙන බවද, ඒ අනුව අදාළ මාසයේ සේවයේ නියුක්ත වන ආකාරය පිළිබඳව සියළුම සේවකයින්ට අවබෝධයක් ලැබෙන බවද සඳහන් කර තිබිණ.

වගඋත්තරකරු ලකුණු කරන ලද R/30, R/31 දරන ලේඛන අනුව හැගර් (Hanger) අංශයේ 2004 පෙබරවාරි මස 01 වැනි දින සිට 29 වැනි දින දක්වා මාසයට අදාළව සේවකයින් අනුයුක්ත කළ බව දැක්වෙන අතර, ඒ අනුව සේවකයින් කාණ්ඩ අටකට වෙන් කර ඇති බවද, එම කාණ්ඩ 1, 2, 3, 4 සහ 1A, 2A, 3A, 4A වශයෙන් සඳහන් කර තිබෙන බවද ඉහත ලේඛනය අනුව පිළිගත හැකිය.

මෙම තාක්ෂණිකයින්ගේ පළමු සේවා මුරය පෙ.ව. 8.00 සිට 17.25 පැය දක්වා වන අතර, එකී මුරය, " M " වශයෙන්ද දෙවෙනි සේවා මුරය 19.00 පැය සිට පසු දින පෙ.ව. 8.25 දක්වා ඇති අතර, එකී මුරය "N" වශයෙන්ද සේවකයින්ට අදාළ විවේක දිනය "X" වශයෙන් හා අතිකාල සේවය " O " වශයෙන්ද සඳහන් කොට තිබෙන R/31 ලේඛනය අනුව අනාවරණය වේ. ඉහත ලේඛනයේ දිනය 2004.01.27 වෙනි දින වශයෙන්ද සඳහන්ව ඇත. ඉහත ලේඛන ඉල්ලුම්කරුවන්ද පිළිගෙන තිබිණ.

ඉහත R/31 ලේඛනය අනුව රාත්‍රී කාලයේ සේවයේ යොදවා ඇති දින ප්‍රමාණය දිවා සේවා මුරයට සාපේක්ෂව අඩු බව ඉහත ලේඛනය නිරීක්ෂණය කිරීමේදී පිළිගත හැකිය.

මෙම රෝස්ටරය පිළිබඳව දැනුම් දීමෙන් අනතුරුව තම තමන්ගේ පුද්ගලික අවශ්‍යතා මත කටයුතු කිරීමට විවේක දිනයන්වල කටයුතු යොදන බවද, ඒ අනුව හදිසියේ රෝස්ටර් වෙනස් කිරීම් තුළින් නොයෙකුත් ගැටළු මතු වන බව ඉල්ලුම්කාර පාර්ශවය සිය කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර තිබිණ.

පෙබරවාරි මාසයේ රෝස්ටර් ක්‍රමයේ වෙනස් කිරීමක් 2004.02.20 වෙනි දිනට අදාළව සිදු කර ඇති අතර, එම දැනුම් දීම සිදු කර

ඇත්තේ R/32 ට අනුව 19.02.2004 වෙනි දිනයේදී බව ඉහත ලේඛනය අනුව අනාවරණය වේ.

ඉහත ලිපිය පරිදි කණ්ඩායම් අංක 3, 2004.02.20 වෙනි දින රාත්‍රී මුරය සඳහාද, කණ්ඩායම් අංක 2 සහ 2A අතිකාල සඳහා 21.02.2004 වෙනි දින රාත්‍රී සේවය සඳහා කැඳවා තිබෙන බව ඉහත ලේඛනය පරිදි පිළිගත හැකිය.

R/31 පරිදි අංක 3 කණ්ඩායමට 2004.02.20 වෙනි දිනය විවේක දිනය වේ. අංක 2 කණ්ඩායමට 2004.02.21 වෙනි දින විවේක දිනයක් බවද, එසේම අංක 2A කණ්ඩායමටද විවේක දිනයක් වශයෙන් සඳහන්ව තිබෙන බව ඉහත R/31 ලේඛනය පරිදි පිළිගත හැකිය.

ඉහත පරිදි හදිසි වෙනස්වීම් සිදු කොට ඉහත කණ්ඩායම් සේවයේ යෙදවීමට තුඩු දුන් විශේෂ හේතුවක් පිළිබඳව සාක්ෂි බේරුම්කරණයට ඉදිරිපත්ව නොතිබුණි. ඉහත වෙනස් කිරීම මත ඉල්ලුම්කාර එම්. ජී. ඒ. ඩී. චන්ද්‍රපාල 3 කණ්ඩායම යටතේ අනුයුක්ත කර ඇති අතර, ඉහත වෙනස්වීම පරිදි සේවයට වාර්තා කර නොතිබුණු බව සනාථ විය. ඊට අදාළ පැමිණීමේ ලේඛනයේ පිටපතක් ඉල්ලුම්කාර පාර්ශවය A /07 වශයෙන් ලකුණු කොට බේරුම්කරණයට ඉදිරිපත් කර තිබුණු අතර, එකී පැමිණීමේ ලේඛනය පරිදි ඉල්ලුම්කරු හැරුණු විට තවත් සේවකයින් හත් දෙනෙක් සේවයට වාර්තා කර නැති බව A/07 ලේඛනය නිරීක්ෂණය කිරීමේදී අනාවරණය වේ.

කණ්ඩායම් අංක 2 හා 2A කණ්ඩායම්ද 2004.02.19 වෙනි දිනැති දැනුම් දීම පරිදි වෙනස් කිරීම් කර ඇති අතර, එම සේවක කණ්ඩායම් 2004.02.21 වෙනි දින රාත්‍රී සේවා මුරයට වාර්තා කළ යුතු වන අතර, ඉහත දිනයට අදාළව පැමිණීම දැක්වෙන ලේඛනය වගඋත්තරකරු භාරයේ තිබියදී A/08 වශයෙන් ලකුණු කොට ඉල්ලුම්කාර පාර්ශවය බේරුම්කරණයට ඉදිරිපත් කර තිබිණ. එම ලේඛනය පරිදි පී. ඒ. ඩී. එස්. පෙරේරා වන ඉල්ලුම්කරු ඇතුළුව හය දෙනෙක් 2004.02.21 වෙනි දින රාත්‍රී මුර සේවයට වාර්තා කර නොමැති බව නිරීක්ෂණය කළ හැකිය.

කණ්ඩායම් අංක 2 A යටතේ සේවය කළ සේවකයින් අතරින් ටී. එම්. ඊ. කාසිම් යන ඉල්ලුම්කරු ඇතුළුව තිදෙනෙක් රාත්‍රී සේවා මුරයට පැමිණ නැති බව A/09 ලේඛනය අනුව අනාවරණය වේ. ඉහත පරිදි කණ්ඩායම් අංක 3 හා කණ්ඩායම් 2 හා 2 A කණ්ඩායම් අතරින් සේවයට වාර්තා නොකිරීම මත සේවය අවසන් කරනු ලැබුවේ එම්. ජී. ඒ. ඩී. චන්ද්‍රපාල, පී. ඒ. ඩී. එස්. පෙරේරා හා ටී. එම්. කාසිම් නැමැති සේවකයින් තිදෙනා පමණක් බවත්, ඉල්ලුම්කාර පාර්ශවය සඳහන් කොට ඇත.

2004 ජනවාරි මාසයට අදාළව හැගර් අංශයේ සේවයේ යොදවන ලද සේවකයින්ට අදාළ ලේඛනය R/34 වශයෙන් ලකුණු කර තිබූ අතර, එකී රෝස්ටරය වෙනස් කිරීමට අදාළව සේවකයින්ට දැනුම් දී තිබූ ලේඛනය R/35 වශයෙන්ද, ලකුණු කොට බේරුම්කරණයට වගඋත්තරකරු විසින් ඉදිරිපත් කර තිබිණ.

R/34 ලේඛනය පරිදි තාක්ෂණිකයින් සේවයට අනුයුක්ත කර ඇත්තේ 2004.12.24 වශයෙන් ඉහත ලේඛනයේ සඳහන්ව ඇතත්, 2004 වර්ෂය දෝෂ සහිතව සඳහන්ව තිබෙන බව ඉහත ලේඛනයේ අන්තර්ගත කරුණු අනුව පිළිගත හැකිය.

R/35 පරිදි 3 A කණ්ඩායමට 2004.01.22 වෙනි දින දිවා සේවා මුරය වෙනුවට රාත්‍රී සේවා මුරයට අනුයුක්ත කොට ඇති අතර, එසේම කණ්ඩායම් අංක 3 2004.01.30 වෙනි දින දිවා සේවා මුරය වෙනුවට රාත්‍රී මුරයට අනුයුක්ත කර තිබෙන බවද 2004.01.13 වෙනි දින දරන R/35 ලේඛනය අනුව අනාවරණය වේ.

R/34 ලේඛනය පරිදි වෙනස් කරන ලද දින දෙකේම 3 කණ්ඩායම හා 3 A කණ්ඩායම පෙරවරු සේවයට වාර්තා කළ යුතුව තිබියදී වෙනස් කර තිබෙන බව පිළිගත හැකිය. A/06 පැමිණීමේ ලේඛනය පරිදි 2004.01.22 වෙනි දින පෙරවරු සේවයට 3 A කණ්ඩායමට අයත් යූ. සී. එම්. පෙරේරා ඇතුළු සේවකයින් පස් දෙනෙකු සේවයට වාර්තා කර තිබූ බවද, එසේ වාර්තා කර තිබියදී යූ. එල්. එම්. පෙරේරා වන ඉල්ලුම්කරුගේ පමණක් සේවය අවසන් කර තිබෙන බව ඉල්ලුම්කාර පාර්ශවය බේරුම්කරණයට කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර තිබිණ.

එම්. වී. එස්. කුරේ නැමැති ඉල්ලුම්කරුට දෙන ලද චෝදනා පත්‍රය වගඋත්තරකරු R/65 (3) වශයෙන් ලකුණු කොට බේරුම්කරණයට ඉදිරිපත් කර තිබිණ.

ඉහත ඉල්ලුම්කරුද දැනුම් දී තිබූ සේවා මාරුව පරිදි 2004.03.19 වෙනි දින රාත්‍රී සේවා මුරයට වාර්තා කර නොතිබූ බව බේරුම්කරණයට ඉදිරිපත් වූ ලේඛන අනුව පිළිගත හැකිය. 2004.03.15 වෙනි දින දරන R/40 ලේඛනය මගින් එම්. වී. එස්. කුරේ නැමැති ඉල්ලුම්කාර සේවකයාට 2004.03.19 වෙනි දින රාත්‍රී සේවා මුරයට වාර්තා කරන ලෙස දැනුම් දී තිබෙන බව ඉහත ලේඛනයේ සඳහන් තොරතුරු අනුව අනාවරණය වේ.

ඕ. එම්. ඒ. ඒ. පෙරේරා නැමැති ඉල්ලුම්කරුටද 2004.03.15 වෙනි දින රාත්‍රී R/41 වශයෙන් ලකුණු කරන ලද ලේඛනය මගින් 2004.03.19 වෙනි දින සේවා මුරයට වාර්තා කරන ලෙස දැනුම් දී තිබූ බව ඉහත ලේඛනය අනුව අනාවරණය වේ.

එම්. වී. එස්. කුරේ කණ්ඩායම් අංක 1 යටතේද ඕ. එම්. ඒ. ඒ. පෙරේරා කණ්ඩායම් අංක 3 යටතේද 2004 මාර්තු මාසයේ සේවයේ යොදවා තිබූ බව R/38, R/39 දරන ලේඛන අනුව පිළිගත හැකිය. R/40 අනුව එම්. වී. එස්. කුරේ 2004.03.19 වෙනි දින රාත්‍රී මුරයට පැමිණිය යුතු වුවද, ඔහු එදින දහවල් සේවා මුරයට පැමිණ තිබූ බව R/42 වන පැමිණීමේ ලේඛනය මත වගඋත්තරකරු කරුණු ඉදිරිපත් කර තිබිණ. එම කරුණු ඉල්ලුම්කාර පාර්ශවය ප්‍රතික්ෂේප කොට නොතිබුණි.

ඕ. එම්. ඒ. ඒ. පෙරේරා R/41 පරිදි 2004.03.19 වෙනි දින දිවා මුර සේවයට පැමිණිය යුතු වුවද, ඔහු පැමිණ නොසිටි බවට වගඋත්තරකරු පැමිණීමේ ලේඛනය R/42 වශයෙන් ලකුණු කරමින් කරුණු ඉදිරිපත් කර තිබිණ.

R/39 ලේඛනය අනුව එම්. වී. එස්. කුරේ නැමැති සේවකයාට 2004.03.20 හා 21 යන දිනයන් විවේක දින බව සඳහන්ව ඇත. මෙම වෙනස් කිරීම අනුව 2004.03.19 වෙනි දින පස්වරු 7.00 ට පැමිණ පසු දින පෙ.ව. 8.25 දක්වා සේවය කිරීමට නියමිත බවද පිළිගත හැකිය. 2004.03.19 වෙනි දින මෙම සේවකයා පෙ.ව. 8.00ට

පැමිණ පෙ.ව. 7.25 ට සේවය අවසන් කර තිබූ බව වගඋත්තරකරු කැඳවන ලද ලසිත් අනුරුද්ධ නැමැති ඉංජිනේරුවරයා හරස් ප්‍රශ්න ඇසීමේදී පිළිගෙන තිබිණ. ඉහත පරිදි රාත්‍රී වැඩ කිරීමේදී අතිකාල නොගෙවන බවද එම සාක්ෂිකරු බේරුම්කරණයේදී පිළිගෙන තිබිණ. R/39 ලේඛනය පරිදි ඕ. එම්. ඒ. ඒ. පෙරේරාගේ විවේක දින 2004 මාර්තු 18 හා 19 යන දිනයන් බවද, එසේ වුවද 2004.03.19 වෙනි දින දිවා මුරයේ සේවය කරන ලෙස ඉල්ලීමක් කල බව R/41 ලේඛනය පරිදි පිළිගත හැකිය.

ඉහත සේවා මාරුවීම් මත මෙම ඉල්ලුම්කරුවන් හැරුණු විට එසේ මාරු කරන ලද සේවකයින් සේවයට වාර්තා නොකලද, ඔවුන්ට විනයානුකූල පියවර නොගත් බව ඉල්ලුම්කාර පාර්ශවය සිය කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර තිබිණ. ඊට අදාළ පැමිණීමේ ලේඛන මත පදනම්ව ඉල්ලුම්කාර පාර්ශවය බේරුම්කරණයට සාක්ෂි ඉදිරිපත් කර තිබූ අතර, වගඋත්තරකරු ඉහත කරුණු ප්‍රතික්ෂේප කොට බිඳ හෙළා නැත.

ඉහත ඉල්ලුම්කරුවන්ගෙන් වැඩමුර මාරු කිරීම මත සේවයට නොපැමිණීම මත හේතු විමසීමක් කර ඇති අතර, ඊට අදාළව හේතු ඉල්ලුම්කරුවන් ලබා දී තිබූ බව සේවය අවසන් කිරීමේ ලිපි අනුව සනාථ වේ. ඉහත ලේඛන බේරුම්කරණයට ඉදිරිපත් නොකිරීම මත නොපැමිණීම සම්බන්ධව සාධාරණ හේතුන් ඉදිරිපත් කර තිබුණේද නැද්ද පිළිබඳව කරුණු අනාවරණය නොවුණි.

සේවය අවසන් කිරීමට පෙර විනය පරීක්ෂණයක් නොපැවැත්වූ බව ඉල්ලුම්කාර පාර්ශවය සඳහන් කර තිබූ අතර, වගඋත්තරකරුද එය ප්‍රතික්ෂේප කොට නොතිබුණි.

ඉහත ඉල්ලුම්කරුවන් හැරුණු විට කේ. ඩබ්. සී. පෙරේරා, එස්. එස්. පී. ඒ. මානිංගොඩ, ජේ. ඒ. අනුර, වී. වික්‍රමසිංහ, එන්. එම්. වී. කේ. රණසිංහ, ජී. ජී. සරත්චන්ද්‍ර, බී. පී. එන්. පෙරේරා යන ඉල්ලුම්කරුවන්ද සේවා මුරයට වාර්තා නොකිරීම මත පදනම්ව චෝදනා එල්ල කර තිබෙන බව R/65 (7), R/65 (8), R/65 (9), R/65 (10), R/65 (11), R/65 (12), R/65 (13) යන ලේඛන අනුව සනාථ වේ. වී. වික්‍රමසිංහ, කේ. එන්. සී. පෙරේරා, ඩබ්. එම්. වී. කේ. රණසිංහ, ජේ. ඒ. අනුර යන ඉල්ලුම්කරුවන් 2004.03.27 වෙනි දින රාත්‍රී සේවා මුරයට නොපැමිණීම මත පදනම්ව චෝදනා නගා ඇති අතර, එස්. එස්. පී. එච්. මානිංගොඩ, බී. පී. එන්. ද සිල්වා, ජී. ජී. සරත්චන්ද්‍ර යන ඉල්ලුම්කරුවන්ට 2004.03.28 වෙනි දින දිවා සේවා මුරයට වාර්තා නොකිරීම මත පදනම්ව ඉහත චෝදනා නගා තිබූ බව ඉදිරිපත් කරන ලද චෝදනා පත්‍ර අනුව පිළිගත හැකිය.

ඉල්ලුම්කාර පාර්ශවය බේරුම්කරණයට කරුණු ඉදිරිපත් කරමින් සේවකයින් 11 දෙනෙකුගේ සේවය අත්හිටුවීමත්, 05 දෙනෙකුගේ සේවය අවසන් කිරීම යන හේතුන් සම්බන්ධව විරෝධයක් දැක්වීම සඳහා පැය 24 ක සංකේත වැඩ වර්ජනයක් සිදු කළ බවද, ඒ පිළිබඳව කළමනාකාරිත්වයට 2004.03.27 වෙනි දින දැනුම් දී තිබූ බවද, ඉහත ලිපියේ පිටපතක් A/31 වශයෙන් ලකුණු කොට බේරුම්කරණයට ඉදිරිපත් කරමින් කරුණු සඳහන් කර තිබිණ. ඉහත ලිපිය වගඋත්තරකරුද පිළිගෙන තිබිණ.

ඉහත ලිපිය පරිදි 17.45 සිට පැය 24 ක කාලයක සංකේත වැඩ වර්ජනයක් කිරීමට පියවර ගන්නා බව දැනුම් දී තිබූ බව ඉහත ලිපියේ දැක්වෙන අතර, බී. පී. එන්. ද සිල්වා බේරුම්කරණයට සාක්ෂි ඉදිරිපත් කරමින් 2004.03.27 වෙනි දින රාත්‍රී මුරයේ සිට 2004.03.28 මුරය දක්වා ඉහත සංකේත වැඩ වර්ජනයක් ක්‍රියාත්මක කළ බව සඳහන් කර තිබිණ. 2004.03.28 වෙනි දිනැති A/37 දරන ලිපිය මගින් ඉහත වැඩ වර්ජනය 2004.03.28 වෙනි දින 17.45 ට අවසන් කරන බවද, වගඋත්තරකරුට දැනුම් දී තිබෙන බව A/37 දරන ලිපියේ සඳහන් කරුණු අනුව අනාවරණය වේ.

ඉල්ලුම්කාර පාර්ශවය ඉදිරිපත් කළ කරුණු අනුව සංකේත වැඩ වර්ජනය පිළිබඳව වගඋත්තරකාර පාර්ශවයට දැනුම් දීමෙන් අනතුරුව ඉහත වැඩ වර්ජනය සිදු කර තිබූ බව පිළිගත හැකිය.

වැඩ වර්ජනයට අදාළව ඉහත ඉල්ලුම්කරුවන්ට නගා ඇති චෝදනා වන්නේ 2004.03.27 වෙනි දින රාත්‍රී මුර සේවයට වාර්තා නොකිරීම හා 2004.03.28 වෙනි දින දිවා සේවා මුරයට වාර්තා නොකිරීම බව නිකුත් කරන ලද චෝදනා පත්‍ර අනුව පිළිගත හැකිය.

ඉහත චෝදනා පත්‍ර ලබා දීමෙන් ලබා දීමෙන් අනතුරුව විනය පරීක්ෂණයට කැඳවූ බවද, එම අවස්ථාවේදී පළමු දිනයෙන් පසුව හරස් ප්‍රශ්න ඇසීම සඳහා දිනයක් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත පරීක්ෂණය නොපැවැත්වූ බව බී. පී. එන්. ද සිල්වා බේරුම්කරණයට සාක්ෂි ඉදිරිපත් කරමින් සඳහන් කරන ලදී.

විනය පරීක්ෂණයක් ආරම්භ කළ බව වගඋත්තරකරු පිළිගත් අතර, එම අවස්ථාවේ තිබූ වාතාවරණය පරිදි කළමනාකාරිත්වය වෙත තර්ජනය කිරීම් හා බිය වැද්දවීම් මත සාක්ෂිකරුවන් සාක්ෂි දීමට නොහැකි බව දැනුම් දීම මත විනය පරීක්ෂණය නිම කිරීමට නොහැකි වූ බව මානව සම්පත් කළමනාකාරිත්වය (නීති) බේරුම්කරණයේදී සාක්ෂි ඉදිරිපත් කරමින් සඳහන් කර තිබිණ.

ඉහත විනය පරීක්ෂණය පැවැත්වීමට ආචාර්ය අර්වින් ජයසූරිය මහතා පත් කල බව වගඋත්තරකරු සඳහන් කල අතර, ඉල්ලුම්කාර පාර්ශවය එය ප්‍රතික්ෂේප කොට නොතිබුණි. විනය පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු යොදා තිබූ බව බී. පී. එන්. ද සිල්වා නැමැති ඉල්ලුම්කරුගේ සාක්ෂියෙන්ද තහවුරු විය.

තර්ජනයක් හේතු කොට ගෙන ඉයන් ඩනිත් මහතා සාක්ෂි ලබා දීම ප්‍රතික්ෂේප කල බව ප්‍රකාශ කලද, එකී ස්ථාවරය බේරුම්කරණයට සාක්ෂි මගින් තහවුරු කිරීමටද, වගඋත්තරකරු අපොහොසත් විය. එම ප්‍රකාශය කරන ලද අවස්ථාවේ සිටි කිසිදු පුද්ගලයෙකු මෙම බේරුම්කරණයට කැඳවීමටද වගඋත්තරකරු අපොහොසත් විය.

මෙම ආරවුල ඇති වූ වකවානුව තුළ නොයෙකුත් තර්ජන තිබූ බව වගඋත්තරකරු කැඳවූ සාක්ෂිකරුවන් වන දඩල්ලගේ සිඩ්නි ද සිල්වා විජේසිංහ, අර්ජුන කපුගීකියන සඳහන් කලද සේවය අවසන් කල සේවකයින් එවැනි තර්ජන කර තිබූ බව බේරුම්කරණයේදී තහවුරු නොවුණි.

රොහාන් මහිලාල් උපසේන වන විමර්ශන නිලධාරි වගඋත්තරකාර සමාගමේ සේවකයින් විසින් කරන ලද පැමිණිලි විභාග කලද, ඉල්ලුම්කරුවන් ඒ සම්බන්ධයෙන් වගකිව යුතු බව අනාවරණය කර ගෙන නොතිබූ බව බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව සනාථ විය.

ඉල්ලුම්කරුවන්ගේ සේවය අවසන් කිරීමෙන් අනතුරුව බෝම්බ ගැසීම් පිළිබඳව සාක්ෂි ඉදිරිපත් වූවද, සේවය අවසන් කල ඉල්ලුම්කරුවන් එම දේවල් කිරීමට සම්බන්ධව සිටි බවට සාක්ෂි ඉදිරිපත්ව නොතිබුණි. අපරාධමය වරදක් වන බෝම්බ ගැසීම වැනි සිද්ධියක් සම්බන්ධව පොලීසියට පැමිණිලි කිරීමෙන් අනතුරුවද ඒ සම්බන්ධයෙන් මෙම ඉල්ලුම්කරුවන් අතරින් කිසිදු අයෙකුට චෝදනා ගොනු කර නොතිබූ බවද අනාවරණය විය. තර්ජනය කිරීම, බෝම්බ ගැසීම්, රථ වාහනවලට හානි කිරීම්, විධායක නිලධාරියෙකුගේ නිළ කාමරයට වමනය වැනි අපද්‍රව්‍ය විසි කිරීම මෙම ඉල්ලුම්කරුවන් විසින් කල බවට කිසිදු සාක්ෂියක් මගින් තහවුරු කිරීමටද වගඋත්තරකරු බේරුම්කරණයේදී අපොහොසත් විය.

ගුවන් යානාවලට හානි කිරීම්, ඇණ දැමීම වැනි දේ සිදුව තිබූ බව ප්‍රකාශ කළද, ඉල්ලුම්කරුවන් එම සිද්ධිවලට සම්බන්ධ බවට කිසිදු සාක්ෂියක් මගින් බේරුම්කරණයේදී තහවුරු කිරීමට වගඋත්තරකරු අපොහොසත් විය.

ඉල්ලුම්කාර වෘත්තීය සමිතිය හා වගඋතරකාර සමාගම අතර සාමූහික ගිවිසුමක් පැවැති බවද, එකී ගිවිසුමේ පිටපතක් R/17 ලේඛනයේ AA වශයෙන් වගඋත්තරකරු ලකුණු කොට බේරුම්කරණයට ඉදිරිපත් කර තිබිණ. බේරුම්කරණයට දෙපාර්ශවයම ඉදිරිපත් කල සාක්ෂි අනුව ඉහත සාමූහික ගිවිසුම ගැසට් පත්‍රයේ පල කර නොතිබූ බවටද, එසේ වුවද ගිවිසුමක් වශයෙන් දෙපාර්ශවයම පිළිගෙන කටයුතු කර තිබූ බවද අනාවරණය විය.

සේවකයින්ගේ විනය කාර්ය පරිපාටිය පිළිබඳව කරුණුද එම ගිවිසුමේ ඇතුළත් බවද ඒ අනුව කටයුතු කල යුතු ආකාරය පිළිබඳව ගිවිසුමෙහි 33 පිටුවේ සඳහන් බව ඉල්ලුම්කාර පාර්ශවය සඳහන් කල අතර, අදාළ ගිවිසුම වන AA ලේඛනය පරිදි එය නිවැරදි බවද පිළිගත හැකිය.

මෙම ඉල්ලුම්කරුවන්ගේ සේවය අවසන් කිරීමේදී විනය පරීක්ෂණයක් නිසි පරිදි පවත්වා ඉල්ලුම්කරුවන්ට තම නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දීමට වගඋත්තරකරු අපොහොසත් වී ඇති බව බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව පිළිගත හැකිය.

ගෘහස්ථ විනය පරීක්ෂණයක් අනිවාර්යෙන් පැවැත්විය යුතු බවට නීතියක් නීතිගත කර නැතැත්, සාධාරණ හා යුක්තිසහගතව මෙවැනි විටකදී කටයුතු කල යුතු බව අප නීතියේද විනිශ්චිත නඩු තීන්දු මගින් පිළිගෙන ඇත. විනය පරීක්ෂණයක් පැවැත්වීම තුළින් චෝදනා ලැබූ අයකුටම තම නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලැබෙන බවද පිළිගත හැකිය.

ස්වාභාවික යුක්ති ධර්ම නීතියේ චෝදනා ලැබූ අයට තම නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දිය යුතුය යන්න පිළිගැනෙන සිද්ධාන්තයකි. මෙම ඉල්ලුම්කරුවන් සම්බන්ධව වගඋත්තරකරු නිසි පරිදි විනය පරීක්ෂණයක් පවත්වා නොමැති බවද, දෙපාර්ශවය එකඟව කටයුතු කල සාමූහික ගිවිසුමේද ඒ පිළිබඳව සඳහන්ව තිබියදී එය නොතකා හැර වගඋත්තරකරු කටයුතු කර තිබෙන බවද, ඉතා කෙටි ක්‍රමයක් අනුගමනය කරමින් ඉහත ඉල්ලුම්කරුවන්ගේ සේවය අවසන් කර තිබෙන බවද බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි තහවුරු වේ.

සේවා මාරු කිරීම් මත සේවයට නොපැමිණීම මත ඉහත ඉල්ලුම්කරුවන්ගේ සේවය අවසන් කර තිබෙන බවද, කම්කරු නීතිය තුළ දිය හැකි උපරිම දඬුවම වන සේවය අවසන් කිරීමේ දඬුවම මෙම ඉල්ලුම්කරුවන්ට ලබා දී තිබූ බවද බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව තහවුරු විය.

ඉහත පරිදි සේවා මුර මාරු කිරීම් ඉහත ඉල්ලුම්කරුවන් හැරුණු විට තවත් සේවකයින්ටද සිදු කර තිබූ බවද, එම සේවකයින්ද මාරු කරන ලද සේවා මුරයට නොපැමිණීම මත ඔවුන්ගේ සේවය අවසන් කර නොතිබූ බවද, බේරුම්කරුණයේදී සනාථ විය. ඉහත පරිදි කටයුතු නොකළ සමහර සේවකයින්ට ඊට අදාළව චෝදනා පත්‍ර පවා ලබා නොදුන් බවටද, ඉල්ලුම්කාර පාර්ශවය කරුණු ඉදිරිපත් කල අතර, වගඋත්තරකරු එම කරුණු බිඳ හෙළීමටද බේරුම්කරණයේදී අපොහොසත් විය.

2004.03.27 වෙනි දින රාත්‍රී සේවා මුරයට හා 2004.03.28 වෙනි දිවා සේවා මුරයට සේවයට නොපැමිණීම සම්බන්ධව පොදුවේ නිදහසට කරුණු ඉදිරිපත් කළ ලේඛනයක පිටපතක් ඉල්ලුම්කාර පාර්ශවය A/38 වශයෙන් ලකුණු කොට තිබූ අතර, එම ලේඛනයේ සේවකයින් 81 දෙනෙක් අත්සන් කර තිබෙන බවද, ලේඛනය අනුව අනාවරණය වේ.

එකම ආකාරයට නිදහසට කරුණු ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සේවකයින් 07 දෙනෙකු තෝරා ගෙන සේවය අවසන් කර තිබෙන බවද, ඊට සාධාරණ හා යුක්තිසහගත හේතූන් තිබූ බව බේරුම්කරණයේදී තහවුරු නොවුණි. කඩාකප්පල්කාරී කරන ලද පිරිසක් ලෙස හඳුනා ගැනීමෙන් අනතුරුව ඉහත පරිදි සේවය අවසන් කල බව වගඋත්තරකරු සඳහන් කලද, එවැනි චෝදනාවක් ඉහත ඉල්ලුම්කරුවන්ට ලබා දෙන ලද චෝදනාවලද සඳහන්ව නැති බවද, ඉහත චෝදනා පත්‍ර අනුව අනාවරණය වේ. එකම සිද්ධියකදී සේවයට නොපැමිණීම මත පදනම්ව වගඋත්තරකරු දෙයාකාරයකට කටයුතු කර තිබෙන බව ඉල්ලුම්කරුවන් වෙනුවෙන් කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර තිබිණ. සියළුම සේවකයින්ගේ සේවය ඉහත පරිදි අවසන් කලහොත් ආයතනය කඩා වැටෙන බව වගඋත්තරකරු බේරුම්කරණයට කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර තිබිණ. ඒ අනුව සේවය අවසන් කිරීමට තීරණය කල සේවකයින්ගේ සේවය අවසන් කිරීමට බලපෑ හේතු තිබිය යුතු අතර, එය සාධාරණ හා යුක්තිසහගත විය යුතු බවද පිළිගත යුතු කරුණක් වේ.

ඉහත ඉදිරිපත් වූ සියළුම සාක්ෂි සැලකිල්ලට ගෙන ඉල්ලුම්කරුවන්ගේ සේවය අවසන් කිරීම සාධාරණ හා යුක්තිසහගත බව වගඋත්තරකරු වැඩි බර සාක්ෂි මගින් තහවුරු කොට නොමැති බවද, ඒ අනුව ඉල්ලුම්කරුවන්ගේ සේවය අවසන් කිරීම අසාධාරණ හා අයුක්තිසහගත බව බේරුම්කරණයට ඉදිරිපත් වූ සියළුම සාක්ෂි සැලකිල්ලට ගෙන මම නිගමනය කරමි.

ඉහත පරිදි සේවය අවසන් කිරීම වෙනුවෙන් ඉල්ලුම්කරුවන්ට ලබා දිය යුතු සහනය කුමක්ද යන්න ඊ ළඟට විමසා බැලිය යුතු කරුණ වන්නේය.

ඉල්ලුම්කරුවන් අතරින් ටී. එම්. ඊ. කාසිම් නැමැති සේවකයා 2011.06.11 වෙනි දින වන විට අවුරුදු 60 ඉක්මවා ඇති බවත්, ඒ අනුව නැවත සේවය වෙනුවට වන්දි මුදලක් ලබා දෙන ලෙස

ඉල්ලුම්කාර පාර්ශවය සිය ලිඛිත සැලකිරීම් මත කරුණු ඉදිරිපත් කරමින් බේරුම්කරණයෙන් අයැද තිබිණ.

වී. වික්‍රමසිංහ නැමැති ඉල්ලුම්කාර සේවකයා බේරුම්කරණයෙන් සහනයක් බලාපොරොත්තු නොවන බවට දැනුම් දීමක් කල බවට, ඉල්ලුම්කාර පාර්ශවය බේරුම්කරණයට දැනුම් දී තිබිණ.

ටී. එම්. ඒ. කාසිම් නැමැති පුද්ගලයා ආබාධිත තත්ත්වයට පත්ව සිටින බව මමද නිරීක්ෂණය කළෙමි. එම ඉල්ලුම්කරු 1987.04.15 වෙනි දින සේවයට බැඳී තිබූ බව වගඋත්තරකරු බේරුම්කරණයට ඉදිරිපත් කල පළමු ප්‍රකාශයේ සඳහන්ව ඇත. ඉල්ලුම්කරුවන්ද එම කරුණ ප්‍රතික්ෂේප කොට නොතිබූ අතර එම ප්‍රකාශයේ පිටපතක් A/24 වශයෙන් ලකුණු කරමින් බේරුම්කරණයට ඉදිරිපත් කර තිබිණ. ඉහත ලේඛනයේ ඉල්ලුම්කරුවන් සේවයට බැඳුණු දිනයන් හා ඔවුන් අවසන් වරට ලද වැටුප් සඳහන්ව ඇති හෙයින් එකී කරුණු අභියෝගයට ලක් නොවූ බැවින් එය නිවැරදි බව පිළිගත හැකිය.

ඉහත ඉල්ලුම්කරුවන්ගේ රැකියාවන් අහිමි වීමෙන් අනතුරුව ඉල්ලුම්කරුවන් නව දෙනෙකු විදේශ රැකියා සඳහා ගොස් තිබූ බවට ඉල්ලුම්කාර වෘත්තීය සංගමය 2007.06.27 වෙනි දිනෙන් යුතුව ඉදිරිපත් කරන ලද ලේඛනයේ සඳහන්ව ඇත. එම ලේඛනයේ පිටපතක් වගඋත්තරකාර පාර්ශවය R/64 වශයෙන්ද ලකුණු කොට බේරුම්කරණයට ඉදිරිපත් කර තිබිණ. ඉහත ලේඛනයේ සඳහන්ව නැති එම්. වී. එස්. කුරේ නැමැති ඉල්ලුම්කරු බේරුම්කරණයට භාර දෙන ලද ඇටර්නි බල පත්‍රය අනුව අබුඩාබි රාජ්‍යයේ සේවය කරන බවද අනාවරණය විය.

බී. පී. එන්. ද සිල්වා නැමැති ඉල්ලුම්කාර සේවකයා බේරුම්කරණයට සාක්ෂි ඉදිරිපත් කිරීමේදී තම වෘත්තීය නිපුණතාවය මත ලංකාවේ රැකියාවක් ලබා ගැනීමට අපහසු බවද, ඒ අනුව විදේශ ගත වූ බවට කරුණු ඉදිරිපත් කර තිබිණ. වගඋත්තරකරු විදේශ රැකියාවක් කිරීම සම්බන්ධයෙන් විරෝධතාවයක් නොදක්වන බවට දැනුම් දී තිබූ බවටද තොරතුරු අනාවරණය විය.

බී. පී. එන්. ද සිල්වා හැරුණු විට වෙනත් ඉල්ලුම්කරුවන් සාක්ෂියට කැඳවීමට ඉල්ලුම්කාර පාර්ශවය අපොහොසත් විය. හර්ෂ මානිංගොඩ විනිශ්චය සභාවේ සාක්ෂියට කැඳවන බව දැනුම් දී තිබියදීත්, එම ඉල්ලුම්කරු කැඳවීමට ඉල්ලුම්කාර පාර්ශවය අපොහොසත් විය.

රැකියාව අහිමි වීම මත පදනම්ව සිදු වූ මූල්‍යමය හානිය, වෙනත් රැකියාවක් ලබා ගැනීමට තිබූ නොහැකියාව සම්බන්ධව බේරුම්කරණයට කැඳවූ සාක්ෂිකරු හැරුණු විට වෙනත් ඉල්ලුම්කරුවන් බේරුම්කරණයේදී සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. විදේශ ගත වූ ඉල්ලුම්කරුවන්ද විටින් විට විනිශ්චය සභාවේ පෙනී සිටි බව කාර්ය සටහන්වල දැක්වෙන තොරතුරු අනුව පිළිගත හැකිය.

ඉහත ඉල්ලුම්කරුවන්ගේ සේවය අහිමි වී ඇත්තේ 2004 මාර්තු හා අප්‍රේල් යන මාසවලදීය. මෙම නඩුව නිම කිරීමට වර්ෂ 09 ක් ඉක්ම වූ කාලයක් ගතව ඇත.

ඉල්ලුම්කරුවන් අතරින් කාසිම් හැරුණු විට සෙසු ඉල්ලුම්කරුවන් හිඟ වැටුප් සමඟ නැවත රැකියාව ලබා දෙන ලෙස සහන වශයෙන් අයැද ඇත.

ඉහත ඉල්ලුම්කරුවන් සියළු දෙනාම තාක්ෂණිකයින් වශයෙන් සේවය කර තිබූ බව තහවුරු විය. මානව සම්පත් කළමනාකාරිනිය බේරුම්කරණයට සාක්ෂිකාරියක් වශයෙන් වගඋත්තරකාර පාර්ශවය කැඳවා තිබූ අතර, ඇය මෙම ඉල්ලුම්කරුවන්ගේ තනතුරට වෙනත් පුද්ගලයන් දීර්ඝ කාලයක් ගතවීම මත බඳවා ගෙන තිබූ බවට කරුණු ඉදිරිපත් කර නොතිබුණි. මෙම සමාගමේ තාක්ෂණික සේවකයින් කොපමණ සංඛ්‍යාවක් සේවයේ යොදවා ගෙන තිබුණේද යන්න පිළිබඳවද සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. රැකියාව බලාපොරොත්තුව තිබියදීත් ඒ පිළිබඳව ඉල්ලුම්කාර පාර්ශවය හරස් ප්‍රශ්න ඇසීමක්ද කර නොතිබුණි.

ඉහත ඉල්ලුම්කරුවන් සියළු දෙනාම විශේෂ පුහුණුවක් ලැබූ සේවකයින් බවද, ඔවුන්ට ගුවන් සමාගමක හැර වෙනත් ස්ථානයක සේවය කිරීමට නොහැකි බවද, වගඋත්තරකාර සමාගම හැරුණු විට වෙනත් සමාගමක් ලංකාවේ නොමැති බවටද බී. පී. එන්. ද සිල්වා සාක්ෂි ඉදිරිපත් කරමින් සඳහන් කර තිබිණ.

ඉහත ආයතනය මූල්‍යමය වශයෙන් පාඩු ලබන බව වගඋත්තරකරු සඳහන් කල අතර, එම කරුණ තහවුරු කිරීම සඳහා වගඋත්තරකරු R/68 දරන වාර්ෂික වාර්තාව බේරුම්කරණයට ඉදිරිපත් කල අතර, එකී ලේඛණයේ ආදායම් විස්තර දැක්වෙන පිටුව R/68 (a) (b) වශයෙන්ද ලකුණු කොට බේරුම්කරණයට ඉදිරිපත් කර තිබිණ. ඉහත කරුණු ඉල්ලුම්කාර පාර්ශවය ප්‍රතික්ෂේප කොට නොතිබුණි. 2003 වර්ෂය වන විට ත්‍රස්තවාදී ක්‍රියා හේතු කොට ගෙන ගුවන් යානා විනාශ වූ බවද, දෙපාර්ශවයම ඉදිරිපත් කල සාක්ෂි අනුව පිළිගත හැකිය.

වගඋත්තරකාර පාර්ශවය බේරුම්කරණයට කැඳවන ලද මානව සම්පත් කළමනාකාරිනියගෙන් ඉල්ලුම්කරුවන්ගේ පුද්ගලික ලිපි ගොනු මත පදනම්ව එම ඉල්ලුම්කරුවන්ගේ සේවා කාලය පිළිබඳව ලැබූ දඬුවම් හෝ ප්‍රශංසා පිළිබඳව මෙන්ම වයස පිළිබඳව කිසිදු සාක්ෂියක් මෙහෙයවීමට ඉල්ලුම්කාර පාර්ශවය අපොහොසත් විය.

ඉහත මානව සම්පත් කළමනාකාරිනිය සිය සාක්ෂියේදී ඉල්ලුම්කරුවන්ගේ පෙර වැරදි වාර්තා තිබූ බවට සාක්ෂි ඉදිරිපත් කොට නොතිබුණි. ඉල්ලුම්කරුවන්ට නඟන ලද චෝදනා පත්‍රවල පෙර වැරදි සම්බන්ධව කරුණු සඳහන් වීමක්ද නොමැති බව ඉහත ලේඛන අනුව පිළිගත හැකිය.

බී. පී. එන්. ද සිල්වා වන ඉල්ලුම්කරු දැනට කටාර් රාජ්‍යයේ ගුවන්යානා තාක්ෂණිකයෙකු වශයෙන් සේවයේ නියුක්තව සිටින බව සඳහන් කල අතර, ඊට අදාළ ඔහු සතු ලේඛනවල පිටපත් R/72 (a), (b), (c), (d) වශයෙන්ද ලකුණු කොට බේරුම්කරණයට ඉදිරිපත් කර තිබිණ. ඉහත ඉල්ලුම්කරුද සිය සාක්ෂියේදී ශ්‍රී ලංකා මුදලින් රු. 460000/- ක් පමණ මාසික වැටුපක් ලැබෙන බව සඳහන් කර තිබිණ. එම සාක්ෂිකරුගේ සාක්ෂිය අනුව සෙසු විදේශගත ඉල්ලුම්කරුවන්ට ඉහත මුදලට හා සමාන වැටුපක් ලැබී තිබූ බවද පිළිගත හැකිය.

මෙම නඩුව විභාග වන අවස්ථාවේදී වගඋත්තරකාර පාර්ශවය ඉල්ලුම්කරුවන්ගේ ලේඛන සිතාසි මගින් ඉල්ලීමක් කිරීමෙන් අනතුරුව ඕ. එම්. ඒ. ඒ. පෙරේරා, එන්. එම්. වී. කේ. රණසිංහ, යූ. එල්. එම්. පෙරේරා, ජී. ජී. සරත්චන්ද්‍ර, එස්. එස්. පී. මානිංගොඩ, පී. ඒ. ඩී. එස්. පෙරේරා, බී. ජී. එන්. ද සිල්වා කම්කරු විනිශ්චය සභාවේ සභාපතිට සහ සහකාර ලේකම්ට ලිපි එවමින් ඉහත සිතාසිය පරිදි කටයුතු කිරීමට පියවර ගෙන නොතිබුණි.

ඉහත සිද්ධියෙන් පසුව වගඋත්තරකරු ඊට විරෝධය පලකර තිබියදීත්, එසේ එවන ලද ලිපි ඉල්ලා අස්කර ගැනීමටද ඉල්ලුම්කාර පාර්ශවය කටයුතු කර නොතිබුණි. මෙවැනි ලිපිවල සාක්ෂිය වැදගත්කමක් නොමැති අතර, එම ලේඛන ලකුණු කරමින් සාක්ෂි විමසූ අවස්ථාවේදී ඒ පිළිබඳව දෙපාර්ශවයටම කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලැබෙන බව පිළිගත හැකිය. බී. පී. එන්. ද සිල්වාගේ එම ලිපියේ පිටපතක් වගඋත්තරකරු R/69 වශයෙන්ද ලකුණු කොට බේරුම්කරණයට ඉදිරිපත් කර තිබිණ.

මෙවැනි ලේඛනයක අඩංගු කරුණු වෙනත් සාක්ෂි මඟින් තහවුරු නොවන විටක, එසේම එහි සඳහන් කරුණු බිඳ හෙළා ඇති විටක එහි ඇති සාක්ෂිමය අගයේ වටිනාකමක් නැති බවද, පිළිගත හැකිය. බී. පී. එන්. ද සිල්වා යන ඉල්ලුම්කරුගේ සාක්ෂියෙන් අනතුරුව වගඋත්තරකරු එහි සාක්ෂ සටහන් ඇතුළත් කොට කාර්මික ආරවුල් පනේත 40 (A) වගන්තිය පරිදි අදාළ ඉල්ලීම අභියාචනාධිකරණයට යොමු කරන ලෙස ඉල්ලීමක් කර තිබුණි.

මෙම නඩුවට R/68 ලේඛනය හැරුණු විට අනෙකුත් ලේඛන අදාළ නොවූ බවද, ඒ අයගේ ලේඛන අධිකරණයේදී බැහැර කළ හෙයින් අපකීර්තියට පත්වීමක් සිදුව නැති හෙයින්ද, අභියාචානාධිකරණයට වාර්තා කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බව තීරණය කරමින් වගඋත්තරකරුගේ ඉහත ඉල්ලීම මම ප්‍රතික්ෂේප කරමි.

ඉහත ඉල්ලුම්කාර වෘත්තීය සමිතිය තාක්ෂණිකයින්ගේ වෘත්තීය සමිතිය වන අතර, දෙපාර්ශවයම එකඟ වූ ගිවිසුම පරිදි 2003 වර්ෂයේ අවසාන කාල පරිච්ඡේදයේදී වැටුප් වැඩි කිරීම සිදු කළ යුතු ප්‍රමාණය සම්බන්ධව එකඟතාවයකට නොපැමිණීම මත දෙපාර්ශවය අතර ආරවුලක් තිබූ බව බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව පිළිගත හැකිය. 2004.04.08 වෙනි දින දරන A/35 දරන ලිපිය මගින්ද වෘත්තීය සමිතිය ඇරඹූ ක්‍රියා මාර්ග තාවකාලිකව අත්හිටුවන බවද, ඉහත ලිපිය මගින් කළමනාකාරිත්වයට දැනුම් දීමෙන් යම් යම් ක්‍රියා මාර්ග ගෙන තිබෙන බවද පිළිගත හැකිය.

ඉහත වගඋත්තරකාර සමාගම මූල්‍යමය වශයෙන් පාඩු ලබන බවට සඳහන් කල කරුණු පිළිගත හැකිය.

ඉල්ලුම්කරුවන් සියළු දෙනාම තාක්ෂණිකයින් වන අතර, ඉහත සමාගමේ ඔවුන්ගේ සංයුතිය හෙවත් සේවක සංඛ්‍යාව කොපමණද යන්න පිළිබඳව සාක්ෂි බේරුම්කරණයට ඉදිරිපත් නොවුණි. මෙම ඉල්ලුම්කරුවන්ගේ සේවය අවසන් කර වසර නවයක් ඉක්මවා ඇති හෙයින් ඔවුන් සේවය කරන ලද තනතුර පුරප්පාඩුව තිබෙන බවට සාක්ෂි බේරුම්කරණයට ඉදිරිපත් නොවුණි. ඉල්ලුම්කරු දැරූ තනතුරුවල පුරප්පාඩු නොමැතිව මෙම සේවකයින්ව සේවයේ පිහිටවුවහොත් සේවක අතිරික්තයක් වන බවද, මූල්‍යමය වශයෙන් පාඩු ලබන ඉහත සමාගමේ අලාභය වැඩිවීමටද එය හේතු විය හැකිය.

ඉහත සඳහන් සියළුම කරුණු සැලකිල්ලට ගෙන ඉල්ලුම්කරුවන්ගේ සේවය අසාධාරණ හා අයුක්ති සහගතව අවසන් කිරීම වෙනුවෙන් ඉල්ලුම්කරුවන්ව නැවත සේවයේ පිහිටුවීමකින් තොරව වන්දියක් ලබා දීම සුදුසු බව මම නිගමනය කරමි.

ටී. එම්. ඊ. කාසිම් වන ඉල්ලුම්කරු 2011.06.11 වෙනි දිනට වයස අවුරුදු 60 සම්පූර්ණ වන බව ඉල්ලුම්කාර පාර්ශවය සිය ලිඛිත සැලකීරීම් මත කරුණු ඉදිරිපත් කර තිබිණ. සෙසු ඉල්ලුම්කරුවන්ට තවදුරටත් සේවය කිරීමට වයස අනුව හැකියාව තිබෙන බැවින් නැවත රැකියාව ලබා දෙන ලෙසද පළමු පාර්ශවය ඉල්ලීමක් කර තිබිණ. ඉල්ලුම්කරුවන් අතරින් 10 දෙනෙකු විදේශ ගතව රැකියාවල නියුක්තව සිටි බවට කරුණු බේරුම්කරණයට ඉදිරිපත් වුවද, බී. පී. එන්. ද සිල්වා හැරුණු විට සෙසු ඉල්ලුම්කරුවන්ගේ ඊට අදාළ කාල පරිච්ඡේදය නිවැරදිව බේරුම්කරණයට ඉදිරිපත් නොවුණි. විදේශ රැකියා සඳහා නොගිය ඉල්ලුම්කරුවන් බේරුම්කරණයට සාක්ෂි ඉදිරිපත් කරමින් තමාට සිදු වූ මූල්‍ය හානිය පිළිබඳව සාක්ෂි ඉදිරිපත් නොකළ අතර, ඒ අනුව රැකියාව නොමැති කාලය තුළ ඉපයීම් පිළිබඳව තොරතුරු බේරුම්කරනයට අනාවරණය නොවුණි.

මෙම ආරවුල නිම කිරීමට වර්ෂ 09ක් ඉක්ම වූ කාලයක් ගතව ඇති අතර, ඊට පාර්ශවකරුවන් වගකිව යුතු නැති බවද පිළිගත හැකිය. ටී. එම්. ඊ. කාසිම් නැමැති ඉල්ලුම්කරුගේ සේවය 2004.03.25 වෙනි දින ලිපිය මගින් අවසන් කර ඇත. ඒ අනුව 2011.06.11 වෙනි දින වන විට වසර 07ක් ඉක්ම වූ කාලයක් රැකියාව අහිමිව සිටි බවද, තහවුරු විය. එම ඉල්ලුම්කරු ඉහත පරිදි සේවය අවසන් කිරීමෙන් අනතුරුව ආබාධිත තත්ත්වයකට පත්ව තිබූ හෙයින් ඔහුට ඔහුගේ සුදුසුකම් මත රැකියාවක නිරත වීමට නොහැකි වී තිබූ බවද, බේරුම්කරණයට ඉදිරිපත් වූ කරුණු අනුව පිළිගත හැකිය.

ඉල්ලුම්කරුවන් 10 දෙනෙකු විදේශ ගත වී රැකියාවල නිරතවීම හේතු කොට ගෙන ලංකාවේ ලබා ගත් වැටුපට වඩා වැඩි වැටුපක් මාසිකව උපයාගෙන තිබූ බවද පිළිගත හැකිය. විදේශගත නොවූ ඉල්ලුම්කරුවන් කිසිවකු බේරුම්කරණයට සාක්ෂි සඳහා නොකැඳවීම මත ඔවුන් ඉහත කාලය තුළ කරන ලද ඉපයීම් පිළිබඳව සාක්ෂි බේරුම්කරනයට ඉදිරිපත් කර නොතිබිණි. ටී. එම්. ඊ. කාසිම් නැමැති ඉල්ලුම්කරු හැරුණු විට සෙසු ඉල්ලුම්කරුවන් තවදුරටත් සේවය කිරීමට හැකියාවක් තිබෙන බවට ඉදිරිපත් කල කරුණු ප්‍රතික්ෂේප කිරීමටද හේතුවක් නැත.

ඉහත සඳහන් සියළුම කරුණු සැලකිල්ලට ගෙන ඉහත ඉල්ලුම්කරුවන්ට නැවත සේවයේ පිහිටුවීමකින් තොරව වන්දියක් ලබා දීම සුදුසු බවද, ඉල්ලුම්කරුවන්ට ඒ අනුව ඔවුන් ලබමින් සිටි වැටුප හා දීමනාව පදනම් කරමින් වසර හයක වැටුප නැවත සේවයේ පිහිටුවීමකින් තොරව වන්දියක් වශයෙන් ලබා දීම සාධාරණ හා යුක්තිසහගත බව මම නිගමනය කරමි.

ඒ අනුව පහත සඳහන් පරිදි වන්දි මුදල් ගෙවන ලෙස මම නියම කරමි.

| | නම | වැටුප | වන්දි ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | ටී.එම්.ඊ. කාසිම් | රු.36490/- | රු.2627280/- |
| 02. | එම්.ජී.ඒ.ඩී. චන්ද්‍රපාල | රු.36490/- | රු.2627280/- |
| 03. | පී.ඒ.ඩී.එස්. පෙරේරා | රු.29000/- | රු.2088000/- |
| 04. | යූ.එල්.එම්. පෙරේරා | රු.29000/- | රු.2088000/- |
| 05. | බී.පී.එන්. ද සිල්වා | රු.33473/ | රු.2410056/- |
| 06. | එම්.වී.එස්. කුරේ | රු.34221/- | රු.2463912/- |
| 07. | ඕ.එම්.එම්.ඒ. පෙරේරා | රු.34864/- | රු.2510208/- |
| 08. | ජී.ජී. සරත්චන්ද්‍ර | රු.22500/- | රු.1620000/- |
| 09. | එස්.එස්.පී.එච්. මානිංගොඩ | රු.36490/- | රු.2627280/- |
| 10. | කේ.එන්.සී. පෙරේරා | රු.33900/- | රු.2440800/- |
| 11. | ජේ.ඒ. අනුර | රු.33137/- | රු.2385864/- |
| 12. | එන්.එම්.වී.කේ. රණසිංහ | රු.30974/- | රු.2230128/- |

ඉල්ලුම්කරුවන්ට ඉහත ආකාරයට බෙදී යන ලෙස රු.28118808/- ක මුදලක් ඉල්ලුම්කරුවන් 12 දෙනාට ගෙවන ලෙසත්, එකී මුදල මෙම ප්‍රදානය ගැසට් පත්‍රයේ පල කිරීමෙන් අනතුරුව මාස 02 ක කාලයක් ඇතුළත ගෙවන ලෙසත්, එකී මුදල සහකාර කම්කරු කොමසාරිස්, මීගමුව මගින් ගෙවන ලෙසත් ඉහත වගඋත්තරකරුට මම නියම කරමි. ඉහත ප්‍රදානය සාධාරණ හා යුක්තිසහගත වන හෙයින් මෙසේ ප්‍රකාශයට පත් කරමි.

පාලිත වීරසේකර,
බේරුම්කරු.

2014 පෙබරවාරි මස 13 වෙනි දින,
කාර්මික අධිකරණයේ දී ය.

03 - 674

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.